මගේ අංකය / எனது இல. / My No. } .විවැ/.සා10/.වාර්ෂික. අ.ස්.මා./2023 ඔබේ අංකය / உமது இல. / Your No. } .......................... දිනය / திகதி / Date } 2023.08. 15

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අනුයුක්ත
සියලුම සංවර්ධන නිලධාරීන් වෙත,

**<u>සංවර්ධන නිලධාරී වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු - 2024 (විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව)</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් වූ මගේ සමාංක හා 2023.06.28 දිනැති ලිපිය හා බැඳේ.

02. යථෝක්ත ලිපිය මඟින් සංවර්ධන නිලධාරීන් සඳහා වූ 2024 වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු ඉල්ලීම් කැඳවීම් කළ අතර 2023.12.31 දිනට වර්තමාන සේවා ස්ථානයේ වර්ෂ 03 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සියලුම සංවර්ධන නිලධාරීන් විසින් මෙම අයදුම්පත යොමු කිරීම අනිවාර්ය විය.

03. නමුත් වර්තමාන සේවා ස්ථානයේ වර්ෂ 03 කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කරන ලද බොහෝ සංවර්ධන නිලධාරීන් ස්ථාන මාරු අයදුම්පත් මෙතෙක් යොමු කර නොමැති බව නිරීක්ෂණය වේ.

04. දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන නියෝග නොසලකා ස්ථාන මාරු අයදුම්පත් යොමු නොකර සිටීම මඟින් ස්ථාන මාරුවලින් වැළකී සිටීමට හැකියාවක් නොමැති බවත්, දෙපාර්තමේන්තුව යටතේ සේවයේ නියුතු සියලුම සංවර්ධන නිලධාරීන් ස්ථාන මාරු සඳහා යටත් වන බවත් තරයේ අවධාරණය කරමි.

05. එමෙන්ම යථෝක්ත ලිපිය මඟින් යොමු කරන ලද ස්ථාන මාරු ප්‍රතිපත්තිය අනුව සිදු කරන 2024 වාර්ෂික ස්ථාන මාරුවීම් කමිටුවේදී නියමිත සේවා කාලය සම්පූර්ණ කරන ලද නමුත් වර්තමාන තොරතුරු සහිතව අයදුම්පත් එවා නොමැති නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනුවල පවත්නා තොරතුරු පදනම් කොටගෙන එම නිලධාරීන් ස්ථාන මාරුවීම්වලට අවස්ථාවෝචිතව යටත් කරන බවත්, පෞද්ගලික තොරතුරුවල නිරවද්‍යතාවය සම්බන්ධයෙන් වන ගැටලු සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව වගකීම භාර නොගන්නා බව වැඩිදුරටත් දන්වා සිටිමි.

**ඊ.එම්. නාලිකා එදිරිසිංහ**
අධ්‍යක්ෂ (පාලන)
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.